# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2460/04 - 2025 ඔක්තෝබර් මස 28 වැනි අඟහරුවාදා - 2025.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය* : DSK/LND/7/F1/12/ACQ/535.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* : අ.ග.පි. 152 (අතිරේක අංක 52)

පහත සඳහන් ඉඩම හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වල්ගම්මුල්ල යන ගම පිහිටා ඇත.

**කැබලි අංක 1623**

ඉඩමේ නම: මහවත්තහේන; ප්‍රමාණය: අක්කර 02; ඉඩමේ විස්තරය: ගෙවත්ත, කොස් පොල් සහිත මිශ්‍ර භෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක් ඇත.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 ජනවාරි මස 28** වැනි දින **පෙ. ව. 10.00**ට කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, **2026.01.21** වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ එය ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

**ආර්. ඒ. චතුරි දමිත්‍රා,**
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2025 ඔක්තෝබර් මස 16 වැනි දින,
කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0244



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: එන්සීපී/එච්ජී/එල්/02/462.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 03ජේ/80/ඩබ්එස්/498.

උක්ත ශීර්ෂය යටතේ *ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 2009 දෙසැම්බර් 10 වැනි දින මවිසින් අංක 1631/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 12-781 යටතේ පළ කරන ලද හා 2010 ජූලි 28 දිනැති අංක 1664/15 දරන *ගැසට් පත්‍රයේ* අංක 08-254 යටතේ සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ යුතු දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
|---|---|
| 2010 අගෝස්තු 25 | 2025 නොවැම්බර් 25 |
| 2010 අගෝස්තු 18 | 2025 නොවැම්බර් 18 |

**ආර්. අයි. බී. සන්ධ්‍යා පී. රත්නමලල,**
ප්‍රාදේශීය ලේකම්,
හිඟුරක්ගොඩ.

2025 ඔක්තෝබර් මස 24 වැනි දින,
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0245

---

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 3/2/3/10/276.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 43/7/2019 එම්ඩබ්ලිව්/186.

නිට්ටඹුව පස්යාල මාර්ග ව්‍යාපෘතිය සඳහා අංක 2254/27-2021 නොවැම්බර් මස 17 වැනි බදාදා දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 15A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද 2021.09.01 දිනැති හා කැඩැස්තර සිතියම් අංක 510607හි කලාප 01 පත්‍ර අංක 16හි කැබලි අංක 503, 505 වශයෙන් පෙන්නුම් කර ඇති ඉඩම් කොටස් 510607 හි කලාප 01 පත්‍ර අංක 24හි කැබලි අංක 01, 02, 03 වශයෙන් සංශෝධනය වී ඇත.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: දොරකඩකුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි තුනක කොටස් ඇත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: චාල්ස් ද සිල්වා විජේරත්න, අංක 48/1, නුවර පාර, නිට්ටඹුව; ප්‍රමාණය: හෙක්. 0.0032

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: දොරකඩකුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: මුහන්දිරම්ලාගේ සෙලින් බර්තා මර්ලින්, අංක 48/1, නුවර පාර, නිට්ටඹුව; ප්‍රමාණය: හෙක්. 0.0007

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: දොරකඩකුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිලි කොටසක් ඇත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: විජේරත්න මුහන්දිරම්ලාගේ ඉන්ද්‍රානි නිරංජනී විජේරත්න; ප්‍රමාණය: හෙක්. 0.0005

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0246

---

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 3/2/3/10/276.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2019 එම්ඩබ්ලිව්/186.

නිට්ටඹුව පස්යාල මාර්ග ව්‍යාපෘතිය සඳහා අංක 2254/27-2021 නොවැම්බර් මස 17 වැනි බදාදා දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 15A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද 2021.09.01 දිනැති හා කැඩැස්තර සිතියම් අංක 510600 හි කලාප 03 පත්‍ර අංක 08හි කැබලි අංක 398 වශයෙන් පෙන්නුම් කර ඇති ඉඩම් කොටස් 510600 හි කලාප 03 පත්‍ර අංක 11හි කැබලි අංක 01, 04, 05, 06 වශයෙන් සංශෝධනය වී ඇත.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: හබලියැද්දේ කුඹුරේ පිල්ලැව සහ පාරේ පිල්ලැව; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක හා තාවකාලික ගොඩනැගිලි දෙකක කොටස් ඇත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: සිංගප්පුලිගේ සෝමරත්න, අංක 24/7, අලුබෝගහලන්ද මාවත, බණ්ඩාරවත්ත, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0117

02. **කැබලි අංක 04**
ඉඩමේ නම: හබලියැද්දේ කුඹුරේ පිල්ලැව සහ පාරේ පිල්ලැව; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: සිංගප්පුලිගේ සෝමරත්න, අංක 24/7, අලුබෝගහලන්ද මාවත, බණ්ඩාරවත්ත, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0004

03. **කැබලි අංක 05**
ඉඩමේ නම: හබලියැද්දේ කුඹුරේ පිල්ලැව සහ පාරේ පිල්ලැව; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: සිංගප්පුලිගේ සෝමරත්න, අංක 24/7, අලුබෝගහලන්ද මාවත, බණ්ඩාරවත්ත, ගම්පහ; ප්‍රමාණය: හෙක්. 0.0001

04. **කැබලි අංක 06**
ඉඩමේ නම: හබලියැද්දේ කුඹුරේ පිල්ලැව සහ පාරේ පිල්ලැව; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: නැසීගිය හේවා රන්දුනුගේ සුනිල්, අංක 157/B, කලල්පිටිය, පස්යාල; ප්‍රමාණය: හෙක්. 0.0016

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0247